# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශේෂ

**අංක 14,727/12 — 1966 දෙසැම්බර් 30 වැනි සිකුරාදා — 1966.12.30**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 30/61.

**1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත**

10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන අයිතිය අත්හැරීමේ ආඥාව

කො/සහිරා විද්‍යාලය, මරදන

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති, ඉමියා මුදියන්සෙලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි සහ 10 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1961 දෙසැම්බර් මස 2 වෙනි දින අංක 12,792 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 360 දරන පැවරුම් ආඥාව, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති දේපළට අදාළ වන පමණට, 1966 දෙසැම්බර් මස තිස් එක් වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි.

ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1966 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. මරදනේ කො/සහිරා විද්‍යාලයේ 1960 ජුලි 21 වන දින පවත්වාගෙන හා නඩත්තු කරගෙන යනු ලැබූ ස්ථානය, එනම්:—

(අ) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නාගරික සභා සීමාව තුල පිහිටියාවූත්, මරදන පාරේ නාගරික වරිපනම් අංක 406 දරන්නාවූත් ; උතුරින් ඩාර්ලි පාරේ නාගරික වරිපනම් අංක 77, 75, 73, 71, 69, 67, 59, ජී. 57, ජී. 49, 43, 39, 35, 33, 29, 27, 25, 23 හා මරදන මුස්ලිම් දෙවස්ථානය පිහිටි මරදන පාරේ නාගරික වරිපනම් අංක 390 දරන ස්ථාන වලින් ද; නැගෙනහිරින්, මරදන පාර, මරදන පාරේ නාගරික වරිපනම් අංක 414, 416, 418, 424, සිමන්ඩ්ස් පාරේ නාගරික වරිපනම් අංක 6 ස්ථානවලින්, මරදන කුඩා මුස්ලිම් දෙවස්ථානය පිහිටි ඉඩමේ බිත්තිය හා අවසර ලත් මිනින්දෝරු හා මට්ටම්කරු ජී. ඒ. එච්. පිලිප්පියා මහතා විසින් සාදන ලද 1959 ඔක්තෝබර් 10 වැනි දින අංක 1409 දරන පිඹුරේ ''බී'' කොටස වශයෙන් දක්වා තිබෙන ඉඩමෙන් ද ; දකුණින් ජී. ඒ. එච්. පිලිප්පියා මහතා විසින් සාදන ලද 1959 ඔක්තෝබර් 10 වැනි දින අංක 1409 දරන ඉහත කී පිඹුරේ ''ඒ'' කොටස හා කොළඹ නාගරික සභාවට අයත් දේපොලින් ද ; බටහිරින් ඩාර්ලි පාර හා ඩාර්ලි පාරේ නාගරික වරිපනම් අංක 95 දරණ ස්ථානයෙන් ද මායිම් වූත්, එකී නාගරික වරිපනම් අංක 406 දරන භූමිභාගයෙන් ; ඊසානයෙන් හා නැගෙනහිරින්, මරදන පාරෙන්ද ; දකුණින් කො/සහිරා විද්‍යාලයේ කාර්යාලයට යන පාරෙන් ද, බටහිරින් හා වයඹින් කො/සහිරා විද්‍යාලයේ කාර්යාලයට යනෙන එකී පාරේ සිට එකී මරදන පාරට වැටී තිබෙන පාරෙන්ද මායිම් වූ ත්‍රිකෝනාකාර භූමිභාගය හැර ඉතිරි බිම් පෙදෙස සම්පූර්ණයෙන්ම.

(ආ) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නාගරික සභා සීමාව තුල පිහිටියා වූත්, අවසරලත් මිනින්දෝරු හා මට්ටම්කරු ජී. ඒ. එච්. පිලිප්පියා මහතා විසින් සාදන ලද 1959 ඔක්තෝබර් 10 වැනි දින අංක 1409 දරන ඉහතකී පිඹුරේ ''ඒ'' කොටස වශයෙන් දක්වා තිබෙන්නාවූත්, උතුරින්, මෙම උප ලේඛනයේ 1 (අ) ඡේදයෙන් විස්තර කරන ලද ඉඩමෙන්ද, නැගෙණහිරෙන් මරදන කුඩා මුස්ලිම් දෙවස්ථාන භූමිභාගයෙන් හා අවසරලත් මිනින්දෝරු හා මට්ටම්කරු ජී. ඒ. එච්. පිලිප්පියා මහතා විසින් සාදන ලද 1959 ඔක්තෝබර් 10 වැනි දින අංක 1409 දරන ඉහත කී පිඹුරේ ''බී'' කොටස වශයෙන් දක්වා තිබෙන භූමි භාගයෙන්ද; දකුණින්, නාගරික වරිපනම් අංක 26 දරන ඔබෙයිද හජ්ජියාර්ට අයත් දේපොලෙන් හා නාගරික වරිපනම් අංක 28/24 හා 23/30 දරන ඇම්. ඇම්. මන්සූන් හා තවත් අයට අයත් දේපොලෙන් හා නාගරික වරිපනම් අංක 28/11 හා 28/23 දරන ඇම්. එච්. ඒ. ඉස්මායිල් හජ්ජියාර්ට අයිති දේපොලින් සහ කොළඹ නාගරික සභාවට අයත් දේපොලින් ද; බටහිරින් මෙම උපලේඛනයේ 1(අ) ඡේදයේ විස්තර කරන ලද ඉඩකඩම්වලින්ද මායිම්වූත්, ඉඩම සම්පූර්ණයෙන්ම.

2. මෙම උපලේඛනයේ 1 ඡේදයෙහි වෙසෙසා දක්වෙන ඉඩම්වල පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

3. ජාතික අධ්‍යාපන සමීක්ෂණ ආකෘති පත්‍රවල ප්‍රකාශිත පරිදි එකී විද්‍යාලය පවත්වා නඩත්තු කරගෙන යාම සඳහා පාවිච්චි කරන ලද සියළුම චංචල දේපොල.

4. අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් උපකෘත මුදල් වශයෙන් එකී පාසලට අය විය යුතු සහ වෙනත් සියළුම ආධාර මුදල්, ගාස්තු, පාඨශාලාවේ අයිතිකරු හෝ වෙනත් කවර තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් එකී පාඨශාලාව සඳහා සහ එය වෙනුවෙන් අයිතිවාසිකම් දරන ලද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් වශයෙන් එකී පාඨශාලාවට අය විය යුතු සියලුම මුදල්.

12–159


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1052/39 — එච් 200—11,050 (66/12.)